ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 118/ News/ 2011

ක්‍රි. ව. 2011 නොවැම්බර් 21 සඳුදා
04 වෙළුම - 05 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



## ආගමන කාලයට
## පුංචි අපිත් සූදානම් වෙමු !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# 2011 වසරේ ආගමන කාලය ලංවන වගයි

## ආදරණීය දුවේ පුතේ...

"ළමා ප්‍රදීපය" කවරයේ කථාව මෙවර සකස් වෙන්නේ නත්තලට පෙර එළඹෙන ආගමන කාලය පිළිබඳව මතක් කිරීමකින්. නත්තලට පෙර එළඹෙන මේ සමය ඇත්තෙන්ම සූදානම් වීමේ කාලයක් බවට පත් වෙනවා. නත්තල "උපත" සිහිපත් කරන මංගල්‍යයයි. මිනිස් බව ගෙන මෙලෝ වැඩිය ගැලවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ "උපත" ඇත්තෙන්ම සූදානමක් ඇතිව සිහිපත් කළ යුතු මංගල්‍යයක් බව අමතක කරන්න එපා.

ආදර දුවේ පුතේ, පාපයේ වහල් බව මුලිනුපුටා දැමීමේ අභිප්‍රායෙන්, කිතු සමිඳුන් මිනිසත් බව ගැනීමේ පළමු ආගමනය අපි සෑම නත්තලක් තුළින්ම සමරනු ලබනවා. එලෙසම කිතු සමිඳාණන්ගේ දෙවන ආගමනය හෙවත් විශ්වය පූර්ණත්වයට පත්වීමේ මංගලාති මංගල අවස්ථාවට සූදානම් වීමේ සමයක් ලෙසටද මෙම ආගමන කාලය හා නත්තල හඳුන්වනු ලබනවා. ඉතින්, මේ අයුරින් ආගමන කාලය හෙවත් සූදානම් විමේ කාල පරිච්ඡේදය තුළත්, නත්තල තුළත් අපි විශේෂයෙන්ම අපේක්ෂා කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ නැවත ආගමනයයි.

ආදර දුවේ පුතේ, ආගමන සමය පූර්ව අධ්‍යාත්මික සමයක්. හරියට ගැඹුරු ඥාන කාන්තියක් වගේ. සති හතරක් පුරා ධර්ම විවේකිව භාවනා යාච්ඤා කරන්නේ "නත්තල" ධාර්මිකව සමරන්නටයි. නමුත් අභාග්‍යයකට අද මේ උපත සමරනු වෙනුවට ජනතාව විසින්ම "උපත" මරණ තත්ත්වයට පත් කරලා. ඇත්තෙන්ම ආගමන සමය හා උපතේ මංගල්‍යය වැදගත් කරුණු දෙකක් මත ගොඩ නැගි මිනිස් ජීවිත පුරා ගලා යනවා. ඒ පැති කඩයන් දෙක තමයි, අධ්‍යාත්මිකත්වය හා ලෞකිකත්වය කියන අංශ දෙක. පළමුව අධ්‍යාත්මික වශයෙන් නැගෙන ගැඹුරු ආනන්දයත්, දෙවනුව එය බාහිරව ජන හදවතට සමරන්නට අවස්ථාවක් ලබා දීමක් ලෙස අර්ථ ගැන්වීමත් අපි හොඳාකාරව වටහා ගන්නට ඕනා. නමුත් අද වෙන්නේ මේ උතුම් සමය තුළ පොපියන අධ්‍යාත්මිකත්වය මිලාන කරන්නට දෙවන කරුණ නිකරුනේ ඉස්මතු කරවීමයි. ආගමන සමයේ සූදානම් වීම ලෞකික මංගල්‍යයක් සැමරීමට නොවේ. ඒ සූදානම අධ්‍යාත්මික මංගල්‍යයක් පුබුදුවා ලීමටයි. ඒ අධ්‍යාත්මික මංගල්‍යය තමයි, සැමරීමට ලෞකික ජන ජීවිතය අවදි කරන්නේ.

ඉතිං ආදර දුවේ පුතේ, අනුන් ගැන නිරන්තරයෙන්ම තම සිත, කය, වචනය යොමු කරන කිතුනුවාට නත්තල බෙදා ගැනීමේ ජීවිත මංගල්‍යයක් බවට පත්වී හමාරයි. ඒ නිසා තමයි අන් අය වෙනුවෙන්ම නිරන්තරයෙන් කැපවී මේ ආගමන සමයේදී කිතුනුවා විවිධ ක්‍රියාවල නිරත වන්නේ. මේ සියල්ල යහපත් වුවත් අපිට නිකම්ම සමාජ සුභසාධන ක්‍රියාවලියකට ආගමන සමය හා නත්තල සීමා කරන්නට බැහැ. මුලින් මතක් කළ අධ්‍යාත්මිකත්වය අනිවාර්යයෙන්ම ඉස්මතු විය යුත්තේ ඒ නිසායි.

බලන්න ශු. බයිබලයේ යෙසායා දිවැසිවරයාගේ වදන් - "අස අසාත් ඔබ කිසිසේත් තේරුම් නොගන්නහුය. දැක දැකත් කිසිසේත් නොපැහැදෙන්නහුය. මන්ද, මේ සෙනඟගේ සිත් අදුරුය. ඔව්හු කන් හොඳට වසාගෙන, ඇස් පියාගෙන සිටිති. එසේ කර ඇත්තේ තමන්ගේ ඇස්වලින් නොදක්නා පිණිසත්, කන්වලින් නොඅසන පිණිසත්, සිතින් තේරුම් ගෙන නොහැරෙන පිණිසත් මා විසින් ඔවුන් සුව නොකරන පිණිසත්ය." (යෙසායා 6/9-10)

ඉතින් දුවේ පුතේ, මේ බයිබලීය පණිවුඩය ඉතා පැහැදිලියි නේද ? පාපයේ වහල් බවින් මිදීමේ මඟ හෙළි පෙහෙළි කිරීමට මිනිස් බව ගත් ජේසු සමිඳාණන්ගේ උපත සමරණ නත්තල පළමුවෙන් පෞද්ගලික වශයෙන්ද, අනතුරුව සමාජීය වශයෙන්ද පාපි පැවැත්ම පිටු දකින සමයක් විය යුතුයි. අද මුළු රටම නෙත් අයා බලා සිටින්නේ කතෝලිකයා මේ නත්තල අධ්‍යාත්මිකව සමරණ ආකාරයයි. ඉතින්, පුංචි ඔබත් ඒ සඳහා හොඳ සූදානමක් මේ ආගමන සමය තුළ ඇත කර ගත යුතුයි. මේ මතක් කිරීම ඒ වෙනුවෙන් බව අමතක කරන්න එපා. ඔබට මෙය කළ හැකියි. ඒ අපේ බලාපොරොත්තුවයි.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා



ආගමන සමය සිහිපත් කරවන ඉටි පහන් සතර

# පුංචි අපි ගමන් කරන්නේ ජේසුගේ අඩි පාරේද ?

ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ ආඥාව නම් " මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න." යන උතුම් ආඥාවයි. උන්වහන්සේගේ ප්‍රේමයේ ආඥාව අපි අනුසාර කරනවාද යන්න මදක් නතර වී සිතා බැලිය යුතුය. අන්ධකාරයෙන් පිරි මෙලොව ඒකාලෝක කළ හැක්කේ හෙට පිපෙන්නට වෙර දරන පුංචි මල් කැකුළු වන් මතු පරපුරටය.



යාච්ඤාව ජේසුස් වහන්සේගේ මුළු ජීවිතයම විය. සෑමවිට යාච්ඤාවේ දිවියක් ගත කළ සේක. උන්-වහන්සේ යාච්ඤාව පිළිබඳ විවිධ වූ අර්ථවත් උපමා මගින් තම ගෝලයනට, තම ජනතාවට දේශනා කළ සේක. එලෙසම ඒ උතුම් ඉගැන්වීම් අප ජීවිතයට ද ඇඟා ගත හැකිය. අපි දෙවි පියාණන්ට යාච්ඤා කළ යුත්තේ කෙසේ ද යන්න උන්වහන්සේගේ දිවිය උරගා බැලීමෙන් අපට ද එලෙස දිවි ගෙවිය හැක. උදැසන අවදිවූ විට මෙවන් අරුත්බර උදැසනක් අපට තිළිණ කළ දෙවිඳුන්ට තුති ප්‍රශංසා කිරීමටත් අප කරන සෑම කටයුත්තක්ම උන්වහන්සේට ප්‍රසන්න අයුරින් ඉටු කිරීමටත් අවැසි වරම් පතා යදිමින් සෑමවිටම අප ජීවිතය යාච්ඤාවේ දිවියක් බවට පත් කර ගැනීමට කිතුනු අපට ද හැකිය.

ජේසුස් වහන්සේ යහපත් බැටළු එඬේරාණෝය. උන්වහන්සේ තම ගෝලයනට තම පියාණන්ට, ජනතාවට අසීමිත ලෙස ප්‍රේම කලා සේම අපිත් අපේ දෙමාපියනට, අසල්වැසියනට දයාව කරුණාව පෑ යුතුය. එහෙත් විෂම වූ වර්තමාන සමාජය තුළ ඒ යහපත් ගති පැවතුම් තිබේදැයි යන්න සැකයට කරුණක් නොවේ ද ? මන්ද යත් වර්තමානයේ නපුර රජකම් කරන ලොවක් බිහිව ඇති හෙයිනි. වර්තමාන සමාජය යොමු වන්නේ අයහපත කරාමය. තම රුධිරය ලෙයට හරවා දහසක් දුක් කරදර විඳ මෙලොවට තමාව ආයාද කළ දෙමාපියන්ව හිත් පිත් නැතිව මහළු නිවාස වලට දමා යන දූ දරුවන් වෙසෙන අද සමාජය තුළට ජේසුස් වහන්සේගේ ජීවිතාදර්ශය මහ මෙරක් සේය. එහෙත් එය තේරුම් ගැනීමට සමාජය සූදානම් නැත. ලෝකය දිවෙන යස ඉසුරු මතය. කෙලෙස හරිහම්බ කළත් මිනිසා යනු තෘප්තිමත් නොවන සත්වයෙකි. මෙලෙස අතෘප්තිමත් මිනිසා වස්තුව පසුපස හඹා යන්නේ මිරිගුවක් පසු පස දිවයන මුව පොව්වෙකු සේය. එලස දිව ගොස් හති වැටුණ පසු දෙවියන් මතක් වීම මනුෂ්‍ය ස්වභාවයයි. අප කරන සෑම කටයුත්තක්ම දේව ප්‍රශංසාව සඳහා ඉටු කළ යුතු වෙමු. අපට ලැබී ඇති තලෙන්තු උපරිම ලෙස සමාජයේ යහපත වෙනුවෙන් මිස අයහපත පතා යොදා නොගත යුතුය. ජේසුස් වහන්සේ තමා ලද ප්‍රඥාව තම ගෝලයන්, ජනතාව වෙනුවෙන් යොදා ගත්තා සේම අපිත් අප ජීවත්ව සිටින කෙටි කාලය තුළ යහපතේ හැසිරිය යුතුය. අප දෙවියන්ට ලංව යහපත කරන කල අපට පැමිණෙන දුෂ්කරතා බොහෝය. එහෙත් අපි හොඳ නරක කුමක්දැයි නිවැරදිව වටහා ගත යුතුය. අපි සෑමවිට ම යහපත් පුද්ගල ඇසුර තබා ගත යුතුය. මන්දයත් අන්ධයෙකුට මඟ පෙන්වීමට තවත් අන්ධයෙකුට නොහැකි හෙයිනි. ජේසුස් වහන්සේ තමා සමීපයට කැඳවා ගනු ලැබුවේ. දමිටුන් නොව පව්ටුන්ය. උන්වහන්සේ පැවසුවේ. "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදෙකුගෙන් එලක් නැත යන්නයි." උන්-වහන්සේ පව්ටුන් මුදා හරිමග යැවූ සේක. අපට හමුවන සෑම පුද්ගලයෙකුම යහමග කරා යොමු කරවීම අපටත් ඉටු කළ හැක. අපේ දෙමාපියන්ට, දෙවියන්ට මෙන් ගරු කළ යුතු වෙමු. අපේ සමාජයේ වෙසෙන සැවොම එක මවකගේ දරු කැළක් සේ සිතා සහෝදර ප්‍රේමයෙන් ජීවත් විය යුතුය. එලෙසිනම් ජේසු සමිඳුන් තුළ තිබූ සමාව දීමේ උතුම් ගුණාංගය ද වර්තමානයට හොඳ ආදර්ශයක් ලබා දෙනු ඇත. උන්වහන්සේ තමන් මරණයට පමුණුවන ලැබූ හේවායන්ට තම අවසාන මොහොතේ දී පවා සමාව දානය කළහ. උන්වහන්සේ සැබෑ පරමාදර්ශී මනුෂ්‍ය පුත්‍රයාණෝය. උන්වහන්සේ මෙන් අපට වැරදි කරන අයට හදවතින්ම කමාව ලබා දෙමු. අපට වෛර කරන අයට ප්‍රේම කරමු. උන්වහන්සේගේ පරමාදර්ශී ජීවිතය අප ජීවිත වලටද එක් කර ගනිමු. එලෙස අප ජීවිත ආලෝකවත් කර ගනිමින් අන්‍ය ජීවිත වලටත් ඒ ආලෝකය පතුරවමු. කිතුනුවා නිරන්තරයෙන් දැල්වෙන පහනක් විය යුතුය. එසේම අප වෙනුවෙන් කුරුසියේ මරණය විඳ, අප වෙනුවෙන් තම ජීවිතය පරිත්‍යාග කළ අපට, විමුක්තිය උදා කර දුන් අප කිතු හිමි පෑ මඟ පියමං කරන ආලෝකයේ දරුවන් බවට පත් වී මේ විශ්වයම ඒකාලෝක කරමු.

**එච්. ඈන්. දිනේෂිකා පෙරේරා**
**12 ශ්‍රේණිය,**
**සිරිකුරුස විදුහල - ගම්පහ**
**(බුරුල්ලපිටිය මීසම)**

# බෝලවත්ත දිසා ධර්මදූත ළමෝ දෙව්මවුන් යදිති



බෝලවත්ත දිසාවට අයත් මීසම් හි ධර්මදූත ළමා සමාජීය දූ පුතුන් වෙනුවෙන් පසුගියදා ජපමාල රැලියක් පැවැත්වුණි. බෝලවත්ත සා. මරියා දෙව් මැදුරේ සිට කඩොල්කැලේ උත්ථාන වූ කිතු සමිඳුන්ගේ දෙව් මැදුර කරා ළමෝ ගමන් කළහ.

මෙයට සහභාගීවූ ළමුන් වෙනුවෙන් විශේෂ දෙසුමක් ගරු ප්‍රදීප් කුමාර පියතුමන් විසින් පැවැත්වූ අතර අවසානයේදී දෙව්මව් පිළිබඳව චිත්‍රපටියක්ද ප්‍රදර්ශණය කෙරෙනි.

බෝලවත්ත දිසා ධර්මදූත ළමා සමාජීය අධ්‍යක්‍ෂ ගරු ගයාන් ප්‍රසන්න පියතුමාගේ අනුශාසකත්වයෙන් දිසා ධර්මදූත සජීවක සජීවිකාවන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරෙනි. **රජිතා වීරසිංහ**

## මීගමුව ආවේ මරියාවෙන් බිහිවූ චෙස් ශූරියක්



ඇය නමින් **රොලින්කා නෝනිස්ය.** පළමුවන ශ්‍රේණියේ සිටම තරගවලට සහභාගීවූ ඇය බොහෝ ජයග්‍රහණ ලබා ගෙන ඇත. ශ්‍රී ලංකා චෙස් සම්මේලනය විසින් සංවිධානය කරනු ලැබූ 2010 ජාතික යොවුන් චෙස් කුසලාන තරගාවලියේ අවුරුදු 10 න් පහළ රන් පදක්කම දිනා ගැනීමට ඇය සමත් වුවාය. ඇය මේ වනවිට දී චීනයේ පැවති ආසියානු යොවුන් චෙස් තරගාවලියට සහ ග්‍රීසියේ පැවති ලෝක යොවුන් චෙස් තරගාවලියට සහභාගි වෙමින් පාසල් මාතාවට විශාල කීර්තියක් අත්කර දී ඇත.

මීගමුවෙන් බිහිවූ පළමු ශ්‍රේණි ගත චෙස් ක්‍රීඩිකාව මීගමුව ආවේ මරියා බාලිකා විදුහලේ හයවන ශ්‍රේණියේ ඉගෙනීම ලබන්නීය.



**රොලින්කා නෝනිස් (මැද ) නිගම්බු ක්වීන් චෙස් සංගමයේ සභාපතිනි හා උපදේශිකා සනෝජා පෙරේරා (දකුණු) චෙස් උපදේශක ප්‍රසන්න කුරුකුල සූරිය (වම )**

2008 වසරේ සිට මෙතෙක් පැවති බස්නාහිර පළාත්, ගම්පහ දිස්ත්‍රික් සහ මීගමු කලාපීය තරග රැසකට සහභාගි වී රන්, රිදී පදක්කම් දිනා ගැනීමට ඇය සමත් වුවාය. චෙස් ක්‍රීඩාවෙන් පෙළහර පානා රොලින්කා නෝනිස් ක්‍රීඩිකාව හට ළමා ප්‍රදීපය සුබ පැතුම් ! **රේමන් අපොන්සු**

කොළඹ අගදරගුරු පදවි ධර්මදූත කාර්යාලය මගින් සංවිධානය කරන අගරදගුරු පදවි නත්තල් කැරොල් ගායනා තරගාවලියේ සමූහ ගායනා අංශයේ තරගයන් සඳහා මොරටුව දිසාව නියෝජනය කිරීමට වරම් ලැබුවේ කටුකුරුන්ද ද මීසමේ ධර්මදූත ළමා සමාජයයි. පසුගියදා පැවති සමූහ ගායනය තරගවලදී විල්ලෝරාවත්ත හා කඩලාන ඒකක තෙවන හා දෙවන ස්ථානයට පත් කරමින් කටුකුරුන්ද ඒකකය ජයග්‍රහණය කරනු ලැබීය. **(අසික)**



**මාසික සිතිවිල්ල**

සේයා : වී. සුනිල් ප්‍රනාන්දු

මෙහි පළ වන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

මාසික සිතිවිල්ල, "නොවැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## මොරටුව, කටුකුරුන්ද මීසමේ දහම් පාසල් ළමුන් සඳහා පැවති ළමා ලේඛක වැඩමුළුවේ නිර්මාණ අභ්‍යාසයේ හොඳම නිර්මාණයන්....

## දෙව්පියාගේ උතුම් තිළිණය

ජීවිතය අපට දුන් තිළිණයකි
රළ පෙරළි සිඳී ගිය නෞකාවක් සේ
කොපමණ බාධා පැමිණියත් අප තුළට
ජීවිතය ජය ගනිමු දෙවිඳුන්ගෙන් ලද තිළිණයක් ලෙසට

සයුරු පතුලේ සැඟව තිබෙන මුතු මැණික්සේ
වටිනාකම් බොහෝය අප ජීවිතයේ
අභියෝග මැද ගත කරන මේ ජීවිතය
ජයගනිමු ජීවිතය සුවදවත් කරවමින්

**තාරුක ප්‍රනාන්දු, 8 ශ්‍රේණිය,**
**සා. මරියා දහම් පාසල, කටුකුරුන්ද - මොරටුව.**



## පිය සෙනෙහස

දස මසක් මා කුසේ දරා නොසිටියද
ලේ කිරි කර මා හට නොපෙව්වද
මව පසුපස සිට මට අත්වැල් බැන්ද ද
මව වාගේ පියා ද මට මව මෙන්ය

දහඩිය හෙලා මා වැඩූ මගේ පිය දෙවිදේ
කරගැට එනතුරා මා හට ඉගැන්වුයේ
මාගේ අනාගතය සරුසාර කරන්නනේ
හැමදාම ඔබ මගේම වේවා පියාණෙනේ

**තරුෂි කාව්‍යා ප්‍රනාන්දු - 7 ශ්‍රේණිය,**
**සා. මරියා දහම් පාසල - කටුකුරුන්ද - මොරටුව**



## අම්මේ

**ප්‍රවීන් පීරිස්,**
**9 ශ්‍රේණිය,**
**ශා. ජුසේවාස් මුනි දහම් පාසල,**
**මෝදර (කටුකුරුන්ද මීසම)**

කවුද මට හොරෙන් මගේ දුක අරන්
මිහිරත් ඔබයි සතුටත් ඔබයි ඒ ඔබ තමයි
මාව ඔබ තරම් දන්න වෙන අයෙක් ඇත්නම්
ලොවේ ඉන්නේ ඔබ පමණයි අම්මේ
මා සනහන ගුණ ඔබේ කිව හැකිදෝ ගීතයෙන්
අහසේ දිලෙනා මහදේ සරනා ඔබගේ ආදරේ
හැමදාම දෙනවාදෝ අම්මේ ඔබේ ආදරේ..
අහසේ දිලෙන මහදේ සරනා ඔබගේ දයාවේ
මා සනහන ගුණ ඔබේ කිව හැකිදෝ ගීතයෙන්
අහසේ දිලෙනා මහදේ සරනා ඔබගේ ආදරේ...




ඉඳුනිල් මිණි රුවක් වැනි
තුරු අතරින් ගලා බසී
මිණි කැට සඟවා ගනිමින්
ගංගාවක් ගලා බසී

වැවට ජලය රැස් කරමින්
කෙත්වතු සරුසාර කරයි
උපරිම සේවයකින් පසු
මහ මුහුදට ගලා බසී

**ගයේෂා පීරිස්**
**6 ශ්‍රේණිය, සා. මරියා දහම් පාසල,**
**කටුකුරුන්ද - මොරටුව**

**එම්. ඈන් රශ්මිකා ප්‍රනාන්දු**
**12 ශ්‍රේණිය,**
**ශා. ජුසේවාස් දහම් පාසල,**
**මෝදර, (කටුකුරුන්ද මීසම)**



## සුදත් සුරිඳුනි

*පරවියෙකු ලෙසින් මා හද තුළ රැඳෙනු සදා....*
*ගිනි දැල්ලක් විලසින් මා හද දවනු මැන සදා...*
*මාරුතය ලෙසින් මා ගත වෙලනු මැන සදා...*
*සුදතුම් වරමින් මා හද වසනු මැන සදා...*

*සුදත් සුරිඳුනි මා හද තුළ රැඳෙනු සදා...*






සාන්ත දොන් බොස්කෝ මුනිතුමන්ගේ ශුද්ධවූ ධාතු ප්‍රදර්ශනය කෙරෙන හැදල පල්ලියවත්ත කාර්මෙල් දේව මාතා දේවස්ථානයේ සිට සජීවී විකාශයක් මෙවර කිතුනු ළමා හමුවෙන් නොවැම්බර් මස 20 වන ඉරුදින සවස 5.00 සිට සවස 5.45 දක්වා ප්‍රචාරය කෙරේ.

# 2011 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

සාමාන්‍ය පෙළ විභාගයේ කතෝලික ධර්ම ප්‍රශ්න පත්‍රයේ අනිවාර්යෙන් පිළිතුරු සැපයිය යුතු කෙටි ප්‍රශ්න 10 සඳහා 2011 නොවැම්බර් 07 වන දින පළවූ කෙටි ප්‍රශ්න 75 සඳහා පිළිතුරු මෙහි පළවේ. ළමා ප්‍රදීපයේ පළවූ මෙම කෙටි ප්‍රශ්න 150 හොඳින් අධ්‍යයනය කරන්න.

76. විශ්වාසය, බලාපොරොත්තුව. දේව ප්‍රේමය
77. ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්
78. කුඹල් කර්මාන්තය, ගඩොල් කර්මාන්තය, කෙත්වල විවිධ කෘෂිකර්මාන්තය.
79. දිව දමනය
80. ආරොන්.
81. ශුද්ධවූ පාවුළු තුමා
82. ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස (ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම - මරණය - උත්ථානය)
83. ශුද්ධවූ සභාවේ මුල් සියවස් කිහිපයේදී ප්‍රසාද ස්නාපනය ලැබූ සැණින්ම අභිවෘද්ධි ආලේපය දානය කළ නිසා ප්‍රසාද නිධාන ලැයිස්තුවේ අභිවෘද්ධි ආලේපය දෙවැනි තැනට ඇතුළත් විය.
84. උපදෙස් දීමේ ප්‍රඥාව, සුව කිරීමේ වරම.
දිවැස් වැකි කීමේ බලය,
විවිධ ශබ්දවලින් කතා කිරීමේ හැකියාව
85. සභාවේ නිල සාක්ෂිකරුවා මෙන් පෙනී සිටීම.
ක්‍රිස්තුන් වහන්සේ මෙන් නව යුවලට දේවශීර්වාදය දානය කිරීම.
86. පාපෝච්චාරණ ආරාධනාව, දයාධික මනස්ථාපනය
87. ආමන්ත්‍රණය, ඉල්ලීම්
88. හෘද සාක්ෂිය
89. ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු ආත්මයෙන් ද ඔබේ මුළු ශක්තියෙන් ද දෙවි වූ ස්වාමින් වහන්සේට ප්‍රේම කරන්න. මෙය උතුම් වූ පළමු වන ආඥාවයි. එය හා සමාන දෙවැනි පණතක් ද වෙයි. එනම්, ඔබට මෙන් ඔබේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න.
90. ජේසු සමිඳුන්ගේ මහිමතාවයෙන් උත්ථාන වූයේ ඉරුදිනකය.
ස්වකීය සභාව වෙත ශුද්ධාත්මයාණන් එවා වදාළේ ඉරු දිනකය.
ජුදෙව්වන් සබත් දිනය ලෙස ගත කළ සෙනසුරාදා වෙනුවට ක්‍රිස්තුන් භක්තිකයන් අපෝස්තලික යුගයේ පටන් ඉරුදින ශුද්ධ ලෙස ගත කළ නිසා.
91. තුති පිදීමේ මහා යාගය හෙවත් දිව්‍ය පූජාව
92. ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, පූජාත්වරය.
93. ජනවාරි 01 - පරිශුද්ධ දේව මාතාවනගේ මංගල්‍යය
අගෝස්තු 15 - දේව මාතා වහන්සේ සුරලොව වැඩම කළ මංගල්‍යය
දෙසැම්බර් 08 - දේව මාතා වහන්සේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය
94. නැතිවූ බැටළුවා පිළිබඳව උපමාව. නැති වූ කාසිය පිළිබඳව උපමාව, නැති වූ පුත්‍රයා පිළිබඳව උපමාව
95. ජුසේ වාස් පියතුමා,
ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා.
96. දෙවන ජුවාම් පාවුළු පාප් තුමා
97. මම වනාහි ස්වයම්භූ නම් තැනැත් වහන්සේ වෙමි.
98. සුවිශේෂක ජොහාන්
99. දෙවියන් වහන්සේ අප හා සමාන මිනිස් බව ගෙන මෙලොවට වැඩම කිරීම.
100. ක්‍රිස්තුන් වහන්සේය.
101. ව්‍යවස්ථාව, දේව මාළිගාව, දෙවියන් වහන්සේ පිළිබඳ ක්‍රිස්තු ඉගැන්වීම.
102. ලාසරස්, නායිම් නුවර වැන්දඹුවගේ පුත්‍රයා, ජයිරස්ගේ දියණිය.
103. පාද දෝවනය
104. සකල ජනතාවගේ යාච්ඤා කිරීමයි (නිල යාච්ඤාව)
105. සමගි සන්ධානය ලබා ගත යුතුය. (පාපෝච්චාරණය)
106. පාපය විනාශ කිරීම.
107. මෙල්කිසදෙක්
108. පදවි පූජක, පැවිදි පූජක
109. ශුද්ධවූ බැසිල් තුමා, ශුද්ධවූ ජෙරම් තුමා, ශුද්ධවූ අගුස්තීනු තුමා, ශුද්ධවූ අම්බ්‍රෝස් තුමා
110. ජපමාල අප ස්වාමිදූගේ දාසියන්ගේ නිකාය.
111. සභාවට, තම පැවිදි පන්තියට. පුද්ගලයාට
112. ශුද්ධවූ බෙනඩික් තුමා, ශුද්ධවූ ජකෝමියස් තුමා
113. ජනතාව ආසිරි ගැන්වීම, ව්‍යවස්ථාවලිය ඉගැන්වීම, පුද පූජා ඔප්පු කිරීම.
114. දිවැසිවර සේවය - ඉගැන්වීම
පූජක සේවය - පූජක
දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමේ සේවය - රාජකීය
115. ලාසරස් - නායින් නුවර වැන්දඹුවගේ පුතා
ධර්මශාලා ප්‍රධානියාගේ දියණිය.
116. මෙලොවට ළමයින් බිහි කිරීම. එම දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබා දීම. දෙදෙනා අතර වෛවාහික ප්‍රේමය
117. ශුද්ධවූ සභාව තුළ පාලනය කිරීම. ශුද්ධවූ සභාව තුළ ඉගැන්වීම. සියලුම ප්‍රසාද නිධාන දානය කිරීම. (ආශිර්වාදකාර බන්ධනය හැර)
118. බැහැපත්කම, කීකරුකම, නිර්භීත කම, බඹරස රැකීම
119. ගෘහස්ථ ජීවිත ක්‍රමයකි.
120. පූජත්වරය
121. ස්පර්ශ කිරීමෙන්, ද්‍රව්‍ය භාවිතයෙන්, වචනයේ බලයෙන්

122. සිය පුත්‍රයාණන් වන ජේසුස් ස්වාමින් වහන්සේ මගින්
123. ජේසුස් ස්වාමින් වහන්සේගේ මාංශගතවීමේ අභිරහස
124. ශුද්ධවූ ඉරේනියස් හෙවත් අයිරේනියස් මුනිතුමාගේ
125. අල්ෆා - ආරම්භය, ඔමේගා - අවසානය
126. දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථයෙනි
127. "එකිනෙකාට ප්‍රේම කරන්න. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න."
128. කන්ද උඩ දේශනය මගිනි.
129. ගලීලය
130. ධර්ම ශාලාවල හෙවත් සිනගෝගවල
131. දිළිඳුන්ට සුබාරංචිය දේශනා කිරීම. වහලුන්ට මිදීම ලැබෙන බව දැන්වීම, අන්ධයන්ට පෙනීම ලැබෙන බව දැන්වීම. පීඩිත වුවන් මිදීම, සමිඳාණන් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කිරීම.
132. දෙවියන් වහන්සේ දර්ශනය කිරීම.
133. කතෝලික පූජකවරුන් රහසින් සැඟවී සිට හමුවුවහොත් මරණ දණ්ඩනය නියම කිරීම. සියලුම කතෝලික ධර්මදූතවරුන් පිටුවහල් කිරීම.
134. මර්සලින් ජයකොඩි පියතුමා
135. ක්‍රි.ව. 1544 දී මන්නාරමේදී ප්‍රාණ පරිත්‍යාගවරුන් ලෙස 600 කට ආසන්න පිරිසක් ජීවිත පූජා කිරීම
136. ආගන්තුක සත්කාරය, දෙමව්පියන්ට ගරු කිරීම.
137. රදගුරුතුමාට හා පූජා ප්‍රසාදි තුමාට සහාය වීම. දේව වාක්‍ය දේශනා කිරීම
138. මාක් - මතෙව් - ලූක්
139. ඒකත්වය - ශුද්ධත්වය - සාධාරණත්වය - අපෝස්තලිකත්වය
140. නෝවා, ආබ්‍රහම්
141. සම්ප්‍රදාය, ශුද්ධ ලියවිල්ල
142. එකම දෙවියන් වහන්සේ බව ඉගැන්වීම. ගැලවුම්කාරයාණන්ගේ පැමිණීම ප්‍රකාශ කිරීම.
143. ක්‍රිස්තුන් වහන්සේ.
144. තියෝපිලස් තුමා
145. ශුද්ධවූ ජෝන් ක්‍රිසොස්තොම් තුමා.
146. පොදු ජනවන්දනාව යනු ක්‍රිස්තුන් වහන්සේ හිස වන්නාවූ ද විශ්වාසකයින්ගේ අවයව වන්නාවූ ද ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය මගින් දෙවියන් වහන්සේට පුදන වන්දනාවයි.
147. සහායදායකයාණෝ සත්‍යතාවේ ආත්මයාණෝ
148. ජම්ම පාපයෙන් නිදොස් වීම. දේව දරුවකු වීම.
149. විශ්වාසය වෙනුවෙන් දිවි පිදූ අය, ක්‍රිස්තියානි වීමට සූදානම් අය.
150. මානසික සහ ශාරීරික වද හිංසා

පසුගිය සතිය හා සබැඳේ.

## II කොටස - අදාර්ශ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු

01. අනිවාර්ය ප්‍රශ්නය
 1. ගීතාවලිය
 2. යෙසායා
 3. ජනතාව ආසිරි ගැන්වීම. ජනතාව වෙනුවෙන් පුද පඬුරු ඔප්පු කිරීම. ව්‍යවස්ථාවලිය ඉගැන්වීම.
 4. ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් මුළු දිව්‍ය පූජාවට සහභාගි වීම.
 5. ජනවාරි 01 - අතිපාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය.
 අගෝස්තු 15 - දේව මාතාවන් වහන්සේ සුරලොවට වැඩි මංගල්‍යය
 දෙසැම්බර් 08 - දේව මාතාවහන්සේ නිර්මල පිළිසිඳිමේ මංගල්‍යය
 6. ප්‍රේමය
 7. සමගි සන්ධානය, රෝගීන්ගේ ආලේපනය,
 8. පූජාත්වරය, ආශිර්වාදකාර බන්ධනය
 9. මනුෂ්‍යත්වයේ විශ්ව විද්‍යාලයය
 10. ජුදාස් වෙනුවට මතියස් තෝරා පත් කර ගැනීම.

02. i. පළමුවන කථාව - පී (පූජක) සම්ප්‍රදාය
 දෙවන කථාව - ජේ. (යාවිස්ත) සම්ප්‍රදාය

 ii. **ප්‍රඥාව සහ තේරුම් ගැනීමේ ශක්තිය.**
 දෙවියන් වහන්සේ ගැනත්, මිනිස් සමාජය ගැනත්, භෞතික ලෝකය හා විශ්වය ගැනත් දැනුම ලබා ගැනිමේ හැකියාව මිනිසා සතුවේ.
 **නිදහස් කැමැත්ත.**
 තෝරාගැනිමට හා තීරණ ගැනීමට ඇති හැකියාවයි.
 **අමරණීයත්වය**
 ශරීරය දිරාපත් වුව ද, මිනිසාගේ ආධ්‍යාත්මිකත්වය විනාශ වන්නේ නැත. ඊට අත්තිවාරම් වන ආත්මය අමරණීය වේ.

 3. නිදහස
 දෙමාපියන්ට උදව් කළ යුතු බව සිතිම
 වැඩිහිටියන් අනවශ්‍ය ලෙස බලපෑම් කරන බව සිතීම.
 තමාගේ ශරීරය හා අන් අයගේ ශරීරයේ වර්ධනය ගැන කරදර වීම.
 අනාගතය පවතින සැකය.
 පවතින දේවල් වල වෙනසක් විය යුතු යැයි සිතිම.

03. i. යෙසායා

 ii. දිළිඳුන්ට සුබ අස්න දේශනා කිරීම, වහලුන්ට මිදීම ලැබෙන බව දැන්විම. පීඩිතවුවන් මිදීම සමිඳාණන් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කිරීම.

11 පිටුවට ....

# ක්‍රිස්තු උපතට සැරසෙන ආ

තවත් ආගමන සමයකට පිවිසී සිටින නිසා මෙවර කලාපයෙන් දූවා දරුවන්ට ආගමන සිරිත් විරිත් ගැන යමක් ඉදිරිපත් කරන්නට මං තීරණය කළා.

ආගමන සමයේ ආරම්භයත් සමග අපට හමුවන ආගමන මල් කලඹ බටහිර ජර්මනියේ ලුතරන් සභාවෙන් ආරම්භවූවක් යැයි කියැවේ. කොළ පැහැති ශාක පත්‍රවලින් සැරසුන මල් කළඹේ ආගමන සති හතර නිරූපනය කරන්නට දම් පැහැති ඉටිපන්දම් තුනක් හා රෝස පැහැති ඉටිපන්දමක් වටේට සවිකර තිබේ. ආගමන සමයේ පළමු ඉරිදා පටන් එක් දම් පැහැති ඉටි පන්දම බැගින් සති දෙකක් එම පැහැති ඉටි පන්දම් දල්වා තෙවන ඉරුදින රෝස පැහැති ඉටි පහන දල්වයි.

ජනවන්දනා වසරේ අවසාන ඉරු දින සැමරෙන්නේ ක්‍රිස්තු රාජ මංගල්‍යයයි. මේ අනුව ඉන් පසු එළඹෙන ආගමන සමයේ මුල් ඉරුදින සැකසෙන මල් කළඹ එක්තරා විදියක ඔටුන්නක රාජකීයත්වයක් ප්‍රකට කරයි. ඒ අනුව එහි හැඩයෙන් කාලයේ සපිරීම දැක්වෙන අතර ඉටි පන්දම් වලින් අඳුරේ අතපත ගාන ලෝකයක දිවැසිවරුන් සංකේතවත්වේ. එමෙන්ම ක්‍රිස්තුන් වහන්සේ උදෙසා දැවීම නිරූපනය වේ.

ආගමන දින දර්ශනයද තවත් අපූරු චාරිත්‍රයකි. කාඩ්බෝඩ් එකක වර්ණවත්ව නිර්මාණය කැරෙන මෙය නිවෙස් වල ජනේල අසල තබයි. ජනේලය විවෘත කිරීමට පෙර දින දී ඊට අදාළ චිත්‍ර මගින් නත්තලට පූර්ව සූදානම නිරූපනය වන අතර දෙසැම්බර් පළමුවැනිදා සිට කුඩා දරුවන්ට අදාල කොටුව විවෘත කිරීමට අවසර ලැබේ. අවසානයේ දෙසැම්බර් 24 වැනි දා




ආගමන දින දර්ශනයක්





# ගමන සමයේ සිරිත් විරිත්

කිතුනු උරුමය

**නත්තලට සූදානම් වන ආගමන සමය නැවත වරක් උදාවී තිබේ. ඒ නිමිත්තෙන් ආගමන සමයේ සිරිත් විරිත් අළලා මෙවර කිතුනු උරුමය වෙන්වේ.**





නිවසේ ඉදිරි දොරටුව විවෘත කැර ක්‍රිස්තු උපත ප්‍රදර්ශනය කැරේ.

චතාරික සමයේ ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තියට අප සූදානම් වන්නාක් මෙන් ආගමන සමයේද වඩාත් කැමති රසමසවුළු වලින් ඇත්ව ක්‍රිස්තු උපතට සූදානම් වීමේ සිරිතක් ඇතැම් රටවල පවතී. ශුද්ධවූ නිකලස් තුමාගේ හෙවත් නත්තල් සීයාගේ මංගල්‍යය යෙදෙන දෙසැම්බර් 06 වැනිදා සහ දෙසැම්බර් 16 සිට 24 දක්වා ‘රත්තරන් රාත්‍රි’ ලෙස හඳුන්වා ආගමන කාලයේ ඊට සූදානම් වීම අපරදිග රටවල තවමත් දක්නට ලැබේ.

මේ සමයේදී කුකීස්, පළතුරු කේක් මෙන්ම විශේෂිත වයින් වර්ගද විශේෂයෙන් ස්කැන්ඩිනේවියානු රටවල දක්නට ලැබේ.

දෙසැම්බර් 13 වැනි දා සාන්ත ලුසී තුමියගේ මංගල්‍ය දිනය ග්‍රෙගෝරියාන දින දර්ශනය සැකසීමට පෙර යුගයේ වර්ෂයේ කෙටිම දිනය විය. ශීත සෘතුවේ ඉතා අඳුරු කෙටි මේ දිනය ආලෝකයේ දිනයක් ලෙස ගිනිමැල දල්වා ඉටි පහන් දල්වා නත්තලට සූදානම් වේ. මේ නිසාම ආගමන සමයේ මේ දිනය ගින්දර හා විවිධාකාරයෙන් බැඳී පවතී. ලුසී තුමියගේ ඉටි පන්දමක් නිවස තුළද, ලුසී ගිනිමැල නිවසින් පිටත ද දැල්වේ. ස්විඩනයේ හා නෝර්වේ රටවල තද කොළ පැහැති කිරුළක් හිස දරා ගත් සුදු ඇඳගත් දැරියක් රාත්‍රියේ නිවැසියන් අවදි කර කෝපි හා කේක් වලින් සංග්‍රහ කරයි. මැය ලුසී මනාලිය ලෙස හැදින්වේ.

මේ අනුව ආගමන සමයේ ආගමික මුහුණුවරක් ගත් සිරිත් විරිත් සමඟින් ඒ ඒ රටවල සංස්කෘතික වටිනාකම් ද ගැබ්වී ඇත.



ආගමන මල් කළඹ

**ශිරාන් මෛත්‍රි**

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

## පාඩම් අංක : 34

### *යමෙකුට යමක් අයිති බව අඟවන හැටි*

අපි යම් කෙනකුට හෝ දෙයකට යමක් අයිති බව අඟවන විදිහ ඉංග්‍රීසියෙන් ලියන හැටි ඊළඟට බලමු.

බලන්න මේ යෙදුම් දිහා :-

Sunimal**'s** book - (සුනිමල්ස් බුක්) - සුනිමල්ගේ පොත
Dog**'s** tail - (ඩෝග්ස් ටේල්) - බල්ලාගේ වලිගය
Kamani**'s** mother - (කමනිස් මදර්) - කමනිගෙ අම්මා

මෙන්න මේ විදිහට "යම් කෙනකුගේ" කියන අදහස දැක්වීමට අපි යොදාගන්නේ **' සහ S** අකුරයි. නමුත් මෙම ' ලකුණ (apostrophe - ඇපොස්ට්‍රොෆි) සහ S අකුර යෙදෙන විදිහ සහ තැන් නිවැරදිව ඔබ දැන සිටිය යුතුයි.

සාමාන්‍යයෙන් මිනිසුන්ට සහ සතුන්ට අයිති දෙයක් ගැන කීමට අපි මෙහෙම ඒ පුද්ගලයා හෝ සත්වයාට කියන නම ආලා ඊට පසුව ( ' සහ S) යොදනවා.

The elephant's tusks - අලියාගේ දළ
The driver's key - රියදුරාගේ යතුර
My Friend's room - යාළුවාගේ කාමරය
Mr. Perera's daughter - පෙරේරා මහතාගේ දුව
The child's toy - ළමයාගේ සෙල්ලම් බඩුව
Manager's office - කළමනාකරුගේ කාර්යාලය

සමහර විට මිනිසුන්ට අයිති දේ කීමට අපි තවත් ක්‍රමයක් පාවිච්චි කරනවා. "Of the" තියන වචන සහිතව ඒ දේ කියන්න පුළුවන්.

The name of the man standing there...
(ද නේම් ඔෆ් ද මැන් ස්ටෑන්ඩිං දෙයාර්...)
අතන සිටගෙන ඉන්න මිනිසාගේ නම...

The duty of the parents.... - (ද ඩියුටි ඔෆ් ද පේරන්ට්ස්)
මව්පියන්ගේ යුතුකම....

The behaviour of students... - (ද බිහේවියර් ඔෆ් ස්ටුඩන්ට්ස්)
සිසුන්ගේ හැසිරීම ... යනාදි වශයෙන්

ඇතැම් අවස්ථාවලදී අපට "of the" යන වචන උපයෝගී කරගෙන අයිතියක් ගැන සඳහන් කරන්න පුළුවන්. සමහර අවස්ථාවල දී මිනිසුන්ගේ පමණක් නොව, දේවල් සහ අදහස් වලට අයිතිබව කීමටත් අපි "of the" යොදා ගන්නවා.

The legs of the table
මේසෙ කකුල් (ඒත් Table's legs කියන්නෙ නෑ)

The roof of the kitchen
කුස්සියේ වහල (The kitchen's roof කියන්නෙ නෑ)

The owner of the shop
සාප්පුවේ අයිතිකරු (Shop's owner කියන්නෙ නෑ)

Name of the book
පොතේ නම (Book's name කියන්නෙ නෑ)

The begining of the month - (ද බිගිනින්ග් ඔෆ් ද මන්ත්)
මාසේ මුල (month's begining කියන්නෙ නෑ)

Back of the car - (බැක් ඔෆ් ද කාර්)
කාරෙකේ පසුපස (Car's back කියන්නෙ නෑ)

ඒත් සමහර අවස්ථාවලදී "Of the" හෝ (' S) හෝ නැතුව නාම පද දෙකක් ඇසුරු කරගෙනත් අපි අයිතිකමක් ගැන කියනවා.

The garage door (garage, door) කියන වචන දෙකම නාම පද. එත් මේ දෙක එක් කරලා "ගරාජයේ දොර" කියන අදහස ප්‍රකාශ කළ හැකියි.

The shop owner - සාප්පුවේ අයිතිකරු. ඒකත් ඒ වගේ.
The door lock - දොරේ අගුල,
Shoe lace - සපත්තුවේ ලේස් එක යනාදියත් ඒ වගේ භාවිතා වන වචන.

සමූහයක් වශයෙන් භාවිතා වන ඇතැම් නාම පද භාවිතා කිරීමේදී අපිට ( 's) යොදන්න පුළුවන්.

The company's success - සමාගමේ සාර්ථකත්වය
Government 's decision - රජයේ තීරණය
එහෙම නැත්නම් The success of the company
The decision of the government කියල යොදන්නත් පුළුවන්.

**ලබන සතියට**

07 පිටුවෙන්

3. යාච්ඤාව තුළ සන්නද්ධ වීමෙන්, බයිබලය තුළින් ලැබෙන පන්නරය ජීවිතයට අදාළ කර ගැනීමෙන්. ජේසුස් වහන්සේ අභියෝග ජය ගැනීමට දේව තාත්තාගේ උදව් ලබා ගත්තාසේ දේව තාත්තාට ජීවිතය භාරදීම.

04. 1. එකිනෙකාට ගෞරව කරන බව. එකිනෙකාට ප්‍රේම කරන බව.
භාර්යාව, ස්වාමි පුරුෂයා ලෙස තම ජීවිතය එකිනෙකා බාර ගන්නා බව.

2. වෛවාහික ප්‍රේමය, දරුවන් බිහි කිරිම, දරුවන්ට නිසි අධ්‍යාපනය ලබා දීම.

3. නාසරතයේ ශුද්ධවූ පවුල වර්තමාන කිතුනු පවුලට ආදර්ශයකි.
නාසරතයේ ශුද්ධවූ පවුල යනු ජුසේ තුමා, මරියතුමිය සහ ජේසු කුමරුය.

1. නාසරතයේ ශුද්ධවූ පවුලේ ජුසේ තුමා යනු වර්තමාන පවුලේ තාත්තාගේ ආදර්ශයයි. එදා ජුසේ තුමා සියල්ලේ දී දෙවියන් වහන්සේ කෙරෙහි රඳා පැවතුණා සේ, වර්තමාන අපේ තාත්තලා ද සියල්ලේ දී දෙවියන් වහන්සේ කෙරෙහි රඳා පැවතිය යුතුය.

2. බැහැපත්කම සියල්ලම සිත්හි රඳා තබා ගැනීම. නාසරතයේ ශුද්ධවූ පවුලේ මරිය අම්මාගේ ජීවිතයේ දක්නට ලැබූ සුවිශේෂි ලක්ෂණ වෙයි. ඒ ලක්ෂණවර්තමාන අම්මලාට ද ආදර්ශයකි.

3. ජේසුකුමරු - වර්තමාන පවුලේ දරුවන්ට ආදර්ශයකි. ප්‍රඥා මහිමයෙන් ගොඩ නැගීමට අන් අයගේ ප්‍රසාදය ලබන්නට ජේසුස් වහන්සේ කදිම ආදර්ශයකි.

05. 1. මහන්සි වී වැඩ කිරීමන්, උරුම වශයෙන් මිලදී ගැනීමෙන්, තෑගි වශයෙන්

2. “ඔබ සර්ව සම්පූර්ණ වන්න කැමැත්තෙහි නම් ගොස් ඔබ සතු සියල්ල විකුණා, දිළිඳුන්ට දෙන්න.” (මතෙව් 19/21)

3. ★ ස්වර්ගයේ වස්තුව සොයා ගැනීමට වෙහෙස ගන්න.
★ සීසර්ගේ දේ සීසර්ටත් දෙවිඳුන්ගේ දේ දෙවිඳුන්ටත් දෙන්න.
★ මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවේ.
★ ඔබට ලැබෙන වැටුපෙන් සෑහි සිටින්න.
★ මෙලොව වස්තුව සියල්ල පහවී යන්නේය. එහෙත්, ස්වර්ගයෙහි කිසිඳු සම්පතක් බැහැරවී නොයන්නේය.

06. 1. පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමාව .

2. යාච්ඤාවේදී බැහැපත් විය යුතුය.
යාච්ඤාවේදි අනුන් හෙළා නොදැකීය යුතුය.
යාච්ඤාවේ දී මුලින්ම මනස්ථාපනය විය යුතුය.

3. ස්වර්ගයෙහි වැඩ සිටින යාච්ඤාවේ ඇති යාච්ඤාමය ගුණාංග 05 ඇතුළත්ව යාච්ඤාව සැමවිටම ගොනු කරන්න.
යාච්ඤාවේ පරමාදර්ශය ස්වර්ගයෙහි වැඩ සිටින යාච්ඤාව නිසා, ස්වර්ගයෙහි වැඩ සිටින යාච්ඤාවට එකඟව කරුනු ගොනු කිරීම උපරිම ලකුණක් ලබා ගැනිමෙට හේතු විය හැකිය.

07. - කෙටි සටහන් ලිවීමේදී ප්‍රධාන කරුණු 5 ක් අනිවාර්යයෙන්ම ලිවිය යුතුය. කරුණු 5 ට ලකුණු 5 ක් ලැබේ.
- කරුණු 05 ක් නැත්නම්, කෙටි සටහනක් ලිවීම ප්‍රයෝජනවත් නොවේ.
- සැමවිටම කරුණු 05 ක් ඇත්දැයි කෙටියෙන් සටහන් කර, මෙවැනි කෙටි සටහන් ලිවීම ආරම්භ කරන්න.
- බයිබලීය පදනමක් ඇති අර්ථාන්විත කරුණු 05 ක් පමණ හොඳ පිවිසුමක් ඇතිව ලිවීමට සැමවිටම වග බලා ගන්න.
උදා. විශ්වාසයේ සංවාදය ගැන කෙටි සටහනක් ලියන්න.
- මේ කෙටි සටහන හොඳ පිවිසුමකින් ආරම්භ කරන්න.

“යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජීවත්වීම නොදනී” යනුවෙන් පවසන ශුද්ධවූ ජෝන් ක්‍රිසොස්තම් තුමා මෙන් ජීවත් වීමට අලුතින් ඇතුළත් වන්නට විශ්වාසයේ සංවාදය හෙවත් යාච්ඤාව අත්‍යවශ්‍ය වූ කරුණකි.

සැකසුම
**කතෝලික අධ්‍යාපන සේවාව - අනුරාධපුර රදගුරු පදවිය**

## ඔබයි අපේ දේව අම්මා



**එස්. පියුමි ශාවින්දි පෙරේරා**
5 ශ්‍රේණිය,
ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ
දහම් පාසල, (උතුරු කළුතර.)

## බදුල්ල රදගුරු හිමිපාණෝ



**විහංගි මධුකලා නවමාලි**
4 ශ්‍රේණිය,
සීවලි නවෝදයා මහා විද්‍යාලය
බණ්ඩාරවෙල.

## මාර්තා සහ මරියා



**ට්‍රෙවෝන් ජයසිංහ**
4 ශ්‍රේණිය,
සා. ජෝසප් දහම් පාසල,
නුගේගොඩ.

## තෙරේසා මව්තුමිය



**සුහේන් රවිඳු සේනාධීර**
3 ශ්‍රේණිය,
සා. මරියා මහා විදුහල,
මීගමුව.

## ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යයක්



**ප්‍රසාදි ලක්ෂානි**
5 ශ්‍රේණිය, නිර්මල හෘදයේ දහම් පාසල,
පොල්වත්ත. (බුරුල්ලපිටිය මීසම)

**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ ඇඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## අන්තිම රාත්‍රි භෝජනය



**සියොන් දිනිත්‍ර කුරේ**
2 ශ්‍රේණිය,
සා. සෙබස්තියන් විදුහල, මොරටුව

## දෙවිඳුන් මැවූ ලෝකය



**මෙලනි මධුෂිකා**
4 ශ්‍රේණිය, සා. ජෝශප් ළමා නිවාසය
නායකකන්ද.

## මුව රංචුවක්



**අයි. ඉමාෂා ගිම්හානි**
8 ශ්‍රේණිය,
සා. ඉසිදෝර් දහම් පාසල,
තිබ්බටුගොඩ

## අපේ දහම් පාසල



**ඩබ්ලිව්. මෙලනි ඈන්**
2 ශ්‍රේණිය, සා. පේදුරු, පාවුළු
දහම් පාසල, රත්නපුර.

**හලාවත පදවිය**

**සුදතුම් වරම් ලැබීම**



නයිනමඩම මීසමේ ළමුන් 80 දෙනෙකු පසුගියදා සුදතුම් වරම් ලැබූහ. නයිනමඩම වික්ෂෝප දේව මාතා දෙව් මැදුරේදී හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙය පැවැති අතර මීසම් සේවක ගරු පයස් නිහාල් මීසම් සහයක ගරු දිලංක නිර්මාන් පියතුමන් ද මීට එක් වූහ. ගරු පියතුමන්ලාගේ අනුශාසකත්වයෙන්, ගරු පැවිදි සොයුරියන් හා දහම් ගුරු භවතුන්ගේ සහයෝගයෙන් මෙහි කටයුතු සංවිධානය කෙරෙනි. ශුද්ධාත්ම වරම් ලැබූ ළමෝ ගරු පියතුමන්ලා හා රදගුරු හිමිපාණන් ද කැටුව ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු මෙහි දිස්වෙති. **සටහන - නිර්මලී ප්‍රනාන්දු, සේයා - චින්තක කුමාර්**



# තිබ්බටුගොඩ දහම් ළමෝ ලේඛක කුසලතා ඔප්නංවාලති

ජනසන්නිවේදනය, පුවත්පත් කලාව හා නිර්මාණකරණය පිළිබඳව ළමුන්ව දැනුවත් කිරීමේ වැඩමුළුවක් පසුගියදා සා. ඉසිදොර් මුනිඳුන්ගේ දෙව් මැදුරේ දී පැවැත්වුණි.

තිබ්බටුගොඩ මීසමේ දහම් පාසල් ළමුන් සඳහා මෙම ළමා ලේඛක වැඩමුළුව පැවැත්වුණි. ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසින් මෙය මෙහෙයවනු ලැබිනි.

තිබ්බටුගොඩ මීසම් සේවක ගරු රංජිත් ටෙරි පියතුමගේ අනුශාසකත්වයෙන් දහම් පාසල් ආචාර්ය මඩුල්ලේ සහයෙන් මෙහි කටයුතු සාර්ථකව සංවිධානය කෙරෙනි.

මෙම අවස්ථාවට දහම් ගුරුභවතුන්, මීසමේ සමති සමාගම්හි පිරිස් හා මීසම් සැදැහවතුන් ද එක්වීම විශේෂත්වයකි. මෙදින ළමුන්ට ලේඛක අභ්‍යාසයක් ලබාදී ඉන් විශිෂ්ටතම නිර්මාණ ළමා ප්‍රදීපය තුළ පළ කිරීමට අවස්ථාව උදාකරදීම ළමුන් ලැබූ සුවිශේෂ අවස්ථාවකි. **සේයා හා සටහන - කැලිස්ටස් ඇන්ටනී**



**( ගරු රංජිත් ටෙරි පියතුමා )**



**මෙම අවස්ථාව එක් වූ ළමුන්ගෙන් කොටසක් සහ දේශක තුමන් ළමුන්ව දැනුවත් කළ අයුරු**

# ඔබත් සොබා දහමට ප්‍රේම කරන අයෙක්ද ?

ආදරණීය දුවේ පුතේ,

"සොබාදහම" කියලා කියන්නේ, අප ජීවත් වන අප අවට වටපිටාවයි. අපත් සොබා දහමේ ම කොටසක්. ගස්වැල්, ඉරහඳ තාරකා, සතුන්, ඇළදොළ, ගංගා, දියඇලි මේ සියලු දේ සොබා දහමට අයිතියි.

මේ ගහකොළ, ඉරහඳ, අප මිය ගිය ද පවතිනු ඇත. අප සොබාදහමට ආදරය කළ ද, නොකළ ද එය අපට සෙනෙහසින් සේවය සලසනවා ඇත. නමුත් දුවේ, පුතේ, අප සොබා දහම කොනිත්තද්දී සොබා දහම අපට දඬු මුගුරු වලින් පහර දෙනවා. දැන් දැන් සිදුවන භූ චලන, සුනාමි, ගංවතුර, නිසි කලට වැසි නොලැබීම වැනි තත්ත්ව වැඩි වී තිබෙන්නේ ඒ නිසා බව වැටහෙනවා නේද ?




ගෝලීය උණුසුම හෙවත් මිහිතලය රත්වීම වර්තමානයේ විශාල ප්‍රශ්නයක් බවට පත්වී තිබෙනවා. මීට හේතුව පවත්නා ස්වාභාවික පරිසර සමතුලිතතාවයට හානිවන පරිදි මිනිසා අහිතකර ලෙස පරිසරය තුළ ක්‍රියා කිරීමයි.

සොබාදහම දෙවියන් වහන්සේගෙන් අප ලද දායාදයක්. උන්වහන්සේ අප හට දැක්වූ ප්‍රේමයේ සලකුණකි. සොබාදාහමේ සාන්තුවරයා ලෙස හඳුන්වන අසීසියේ ශු. ප්‍රැන්සිස් මුනිතුමා සොබා දහමට බොහෝ සේ ආදරය කළා. සොබාදහම තුලින් දෙවිඳුන්ගේ හස්තයේ මහිමය, ප්‍රභාව, ප්‍රඥාව අත්දැකිය හැකි බව එතුමන් ප්‍රකාශ කළා.

නමුත් අප මේ සොබාදහමේ අසිරිය විඳිනවාද ? නැතහොත් එයට කෙනෙහිලිකම් කරමින් විඳවනවාද ? සිත්තන් පුංචි ඔයාලට මොනවාද මේ ගැන කරන්න පුළුවන් කියලා. ස්වාභාවික සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගනිමින් එය අපෙන් පසුව එන නංගිලා, මල්ලිලාටත් උරුම කර දීම අපේ යුතුකමක් වගේම වගකීමක් ද වෙනවා. කපන ගසක් වෙනුවෙන් පැළ දෙකක්වත් සිටුවීම තුළින් මෙහිලා දායක වෙමු. පොලිතින්, ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම හැකිතාක් අවම කරමු. අප නිදහසේ ජීවත් වෙනවා වගේම අහිංසක සතුන්ටත් නිදහසේ ජීවත් වීමට ඉඩ හරිමු.

ආදර දුවේ පුතේ, පරිසරය රැක්කොත් අපත් රැකෙන බව අවබෝධ කරගනිමින්, අප සිත් සතන් පහන් කරවන සොබා දහමේ සුන්දරත්වය සතුටින් විඳ ගනිමු. ඒ තුළින් දෙවි සමිඳාණන්ගේ බලපරාක්‍රමය අත්දකිමු.

**මාරියන් නිලානි කත්‍රිආරච්චි**
**(ආචාර්ය මඩුල්ල ) ජාකොමේ ගොන්සාල්වෙස් දහම් පාසල**
**බෝලවත්ත.**

## මට්ටක්කුලිය මීසමේ ධර්මදූත ළමෝ පදක්කම් පළඳති



මට්ටක්කුලිය මීසමට අයත් ධර්මදූත ළමා සමාජයේ සිංහල හා දමිළ ළමුන් 78 දෙනෙකු හට පසුගියදා පදක්කම් පැළඳුහ. මීසම් පාලක ගරු කැලිස්ටස් ප්‍රනාන්දු, ධර්මදූත පදවි අධ්‍යක්ෂ ගරු කිත්සිරි තිරිමාන්න, ගරු රෝයි මරියරත්නම් යන පියතුමන්ලාගේ සහභාගීත්වයෙන් පැවති මෙයට මෙම දරුවන්ගේ දෙමාපියන් හා සජීවක සජීවිකාවන් ද සහභාගි විය. **රසිකා ජයමිණී**

## ප්‍රසාද ස්නාපනය දානය කිරීම



**ඉසුරු අංජන, 10 ශ්‍රේණිය,**
**සා. මරියා දහම් පාසල, කටුකුරුන්ද - මොරටුව**

## මා දිවියේ ආලෝකය ඔබයි !

අඳුරින් පිරි සිත් ඇතුලේ - ආලෝකය ඔබයි පියේ...
මුලාව ගිය ගමන් මගේ - නිවැරදි මග ඔබයි පියේ...

ලෝ පව් සෝදා, ඔබෙ ශ්‍රී රුධිරෙන්
අප සිත් පහදා, ඔබේ ශ්‍රී හෘදෙන්
දොරගුළු හැරලා. ඔබ වෙත එන්නට
ඇරියම් කෙරුවා, ඔබෙ නෙතු කැල්මන්

ඔබ පැසසීමට ...ඔබෙ ගුණ ගැයුමට..
මා හද තෙරපෙන - වදන් ගොනුවකි මේ...
ජේසුනේ ... ජේසු සමිඳුනේ...

**අචිනි කෞශල්‍යා ප්‍රනාන්දු**
**11 ශ්‍රේණිය,**
**ශා. සෙබස්තියන් දහම් පාසල,**
**බංගදෙනිය.**

## අපි වෙමු කිතුනු ළමුන් හඳුනාගනිමු



**නම** - අවිශ්ක විශ්මාල්

**ශ්‍රේණිය** - 6 ශ්‍රේණිය

**දහම් පාසල** - සා. අන්තෝනි දහම් පාසල නයිනමඩම

**කුසලතා** - චිත්‍ර, වාර්තා

## අපි වෙමු කිතුනු ළමුන්

ළමා ප්‍රදීපය

නම :- ..........................................................................

ලිපිනය :- ..........................................................................

පාසල :- ..........................................................................

පංතිය :- ..........................................................................

උපන් දිනය :- ...................... නිවසේ දු. අ. ..................

දහම් පාසල :- ..........................................................................

මීසම :- ..........................................................................

සහභාගි වන සමිති සමාගම් :- ......................................

කුසලතා දක්වන ක්ෂේත්‍රය :- ..........................................

(කවි කෙටි කතා. චිත්‍ර වාර්තා, වෙනත් )

අපි වෙමු කිතුනු ළමුන් වැඩ සටහනට මා ද ඇතුළත් කර ගන්න.

.................................. ..................

අත්සන දිනය

**අපි වෙමු කිතුනු ළමුන් ළමා පාඨක එකමුතුවේ ලියාපදිංචි වීමට ඔබත් කැමති නම් ඉහත ළමා ප්‍රදීපය ලාංඡනය සහිත පත්‍රිකා තුනක් එකතු කර අයැදුම් පත්‍රය පුරවා 2x2 ප්‍රමාණයේ ඡායාරූපයක් සමග අපි වෙමු කිතුනු ළමුන්, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 ලිපිනයට තැපැල් කරන්න.**

## ප්‍රහේළිකා අංක 27



### හරහට

1. සැම දේටම වඩා වැදගත් වන්නේ ප්‍රේමය බව ශු. පාවුළුතුමා මොවුන්ට යවන ලද පළමු ලිපියෙහි සඳහන් වේ.
4. ශු. ලියවිල්ලේ සළමොන්ගේ ප්‍රඥාව පොතේ පවසන්නේ, ප්‍රඥාව මෙයට වඩා අගනා බවයි.
5. ක්‍රිස්තුන් වහන්සේ මෙය මතදී අප වෙනුවෙන් දිවිපිදූ සේක.
7. ............ ක් නැති ඉඩම කොල්ලකනු ලබන්නේයැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. ස්නාවක ජුවාම් තුමාගේ පියා

### පහළට

1. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව ප්‍රදර්ශන දොරටුව අසල සිටි මෙවැන්නෙකු පේදුරු තුමා සුව කළේය.
2. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වන විට දේව මාළිගාවේ මෙය දෙකඩව ඉරීගිය බව ශු. ලියවිල්ලේ සඳහන් වෙයි.
3. රන්කාසි දසය පිළිබඳ උපමාවේ, ස්වාමියා රාජ පදවියක් ලබන පිණිස මෙහි ගිය බව පැවසේ.
6. තම අසල්වැසියා හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙම ජාතිකයාගේ උපමාව වදාළ සේක.
8. එළියා දිවැසිවරයා එම රටේ වූ තුන් අවුරුදු නියගය නිම කරමින්, දෙවියන් වහන්සේ සැබෑවූ එකම දෙවියන් වහන්සේ බව මිනිසුන්ට පෙන්වමින් මෙය ලබා දුන්නේය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් පරිච්ඡේදය ආධාර කරගත හැකිය. ශු. ලුක් 10,19, 23 පරිච්ඡේද, ක්‍රියා 3, ශු. මතෙව් 5, 1 රාජාවලිය 17, සලමොන්ගේ ප්‍රඥාව 7, උපදේශකයා හෙවත් සිරාක් 36, 1 කොරින්ති 13)

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 26, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**




කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හි, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා